| 24-03-2026 | උදෑසන මුරලි | ඕම් ශාන්ති | බාප්දාදා | මධුබන් |
|---|---|---|---|---|

| | |
|---|---|
| **සාරය:** | සුමිහිරි දරුවනි, ඔබේ ගෙදර පවුල සමඟ ජීවත් වන ගමන්ම නෙළුම් මලක් සේ පිරිසිඳු බවට පත් විය යුතුයි. පියාගේ උපදෙස් පිළිපදින්න. කොයියම්ම හෝ සේවා විරෝධී දෙයක් නොකරන්න. |
| **ප්‍රශ්නය:** | මායා තදින්ම පහර දෙන්නේ කුමන දරුවන්ටද? ඉහළම අරමුණ කුමක්ද? |
| **පිළිතුර:** | මායා තදින්ම පහර දෙන්නේ ශරීර අවධානයේ ම සිටින දරුවන්ටය. ඔවුන් නමට සහ ස්වරූපයට හසුවේ. ශරීර අවධානය ආ ගමන්ම පහර වදී. එයින් තත්ත්වය විනාශ වී යයි. බාබා මෙසේ කියයි දරුවනි, ජීවාත්ම අවධානයට පත් වන්න! පියා ඔබේ කීකරු සේවකයා මෙන්ම මමායනයෙන් තොර වනවා සේම ඒ නිසා ඔබත් එසේ ම විය යුතුයි. සුළු හෝ ලොකුකමක් නොතිබිය යුතුය. |
| **ගීතය:** | ඔබ අපෙන් වෙන් නොවන්නා සේම අපේ හදවත් තුළ දුක ද තුරන් වේ... |

ඕම් ශාන්ති. ඔබ දරුවන් ගීතය ඇසුවා. දරුවන් මෙසේ කියයි අපි අශරීරික ලෝකයේ සිටිනා විට බාබා අපිට අයත් වන අතර අපි බාබාට අයත් වේ. ඔබ දරුවන්ට පැහැදිලිම ඥානය ලැබී තිබෙනවා. ඔබ දන්නවා ඔබ චක්‍රය පුරාම ආ බව. අපි නැවතත් වතාවක් දැන් ඔහුට අයිති වී ඇත. රාජයෝගා උගන්වා අපට දෙව්ලොව අයිති කර දීමට ඔහු පැමිණ ඇත. ඔහු හරියටම පසුගිය කල්පයේ ආවා සේම නැවතත් පැමිණ ඇත. පියා මෙසේ කියයි ඕ දරුවනි, ඉතින් ඔහුගේ දරුවන් වූ පමණින් මධුබන් තුළට වී නොසිටින්න. ගෙදර පවුල අතර සිටිමින්ම නෙළුම් මලක් සේ පිවිතුරු වන්න. නෙළුම් මල ජලයේ සිටිමින්ම ඊට ඉහළින් සිටී. වතුර නොගෑවී සිටී. පරම පියා මෙසේ කියයි ඔබ ගෙදර සිටිය යුතුයි. නමුත්, පිවිතුරුව. මේ ඔබේ බොහෝ උපත් හි අවසාන උපතයි. මා පැමිණ ඇත්තේ සියලු මනුෂ්‍යයන් පාරිශුද්ධියට පත් කිරීමටයි. සියල්ලන්ගේම පාරිශුද්ධකරුවාද ගැලවුම් කරුවාද වන්නේ එකම කෙනාය. හැම කෙනෙක්ම පිරිසිඳු කළ හැක්කේ ඔහුටම මිස වෙන කිසිවෙකුට නොවේ. ඔබ දන්නවා ඔබ චක්‍ර බාගයක්ම ඉණිමගේ පහළට බැස ඇති බව. ඔබ නියතයෙන්ම උපත් 84 ම සම්පූර්ණ කළ යුතු වනවා. එසේ වී ඔබ සම්පූර්ණ දිරාපත් වූ තත්ත්වයට පත් වූ විටයි මා පැමිණිය යුතු වන්නේ. ඊට පෙර කිසිවෙකුට ඔබ අපිරිසිඳු බවින් පිරිසිඳු බවට පත් කළ නොහැක. පරම පියා සහ ඔහුගේ නිර්මාණ කිසිවෙක් නොදනී. නාටකයට අනුව, හැම කෙනෙක්ම කලි යුගයේ දී අපිරිසිඳු සහ තමෝප්‍රධාන් බවට පත් වෙයි. පරම පියා පැමිණ සැම කෙනෙක් ම පිරිසිඳු කර සාම දේශයට රැගෙන යයි. ඉන්පසු ඔබ පියාගෙන් සතුටු දේශයේ උරුමය ලබා ගනී. සත් යුගයේ දී දුක බිඳක් වත් නැත. ජීව මරණයට පත් වූ ඔබ පියාට අයිති වී ඇත. පරම පියා මෙසේ කියයි ඔබ ගෙදර පවුල සමඟ ජීවත් විය යුතුයි. ඔබ කිසිවෙකුට ඔබේ ගෙදර හෝ පවුල් අත් හැරීමට කිසිවිට නොකියයි. නැත. පවුල සමඟ සිටින ගමන්ම ඔබ මෙම අවසාන උපතේ දී පිරිසිඳු බවට පත්වීම පමණයි ඇත්තේ. බාබා කවදා හෝ කිව්වාද ඔබට ගෙදර හා පවුල අතහරින්න කියා. නැත. ඔබ දේව සේවය කිරීම සඳහා ඔබ විසින්ම ගෙවල් අතහැරියා. සමහර දරුවන් එසේ ගෙදර සිටම සේවය කරයි. ඔවුන්ට ගෙවල් අතහැරීමට ක්‍රියා කළේ නැත. බාබා ඔබ කිසිවෙකුට ගෙවල් අතහැරීමට නොකියයි. ඔබ විසින්මයි ඔබ සේවයට ආවේ. ඔබේ භෞතික පියා ඔබට දීග යාමට කියයි. දැන් මරණයේ දේශයේ අවසානය නිසා ඔබ ඊට හසු නොවේ. විවාහ වීම නිසා ඔබ නටඹුන් වන නිසා පාරිශුද්ධත්වයට පත් විය හැක්කේ කෙසේද? ඒ වෙනුවට, ඔබ භාරතය දෙව්ලොව බවට පත් කිරීමේ කාර්යයේ නිරත නොවන්නේ ඇයි? දරුවන්ට රාම රාජ්‍යය අවශ්‍යයි. ඔවුන් මෙසේ කෑගසයි ඕ පාරිශුද්ධකරුවාණනි, සීතා සතු රාමා, රාමා, පැමිණ භාරතය දෙව්ලොව බවට පත් කරවන්න. කියමනට කිව්වාට ඔවුන් කිසිවක් තේරුම් ගෙන නැත. සන්‍යාසීන් කියන්නේ මෙකල සතුට කපුටු වසුරු හා සමාන බවයි. එය එසේමයි. මෙහි කිසිඳු සතුටක් නැත. ඔවුන් මෙය කිව්වත් ඔවුන්ගේ බුද්ධියට ඇතුළු වන්නේ නැහැ කවදාකවත් ඔබ අසතුටට පත් වන ලෝකයක් නිමවන්නේ නැති බව. පරම පියා මෙසේ කියයි ඔබට අමතක වුණාද, සත් යුගයේ දී දුකෙහි නම හෝ බිඳක් නැති බව? කාන්ස් ආදී යක්ෂයින් කොහෙන් එන්නද? ඔබ දැන් අසීමිත පරම පියා ඔබට දෙන උපදෙස් පිළිපැදිය යුතුයි. ඔබේ මන්මත් පාවිච්චි කිරීමෙන් ඔබ නටඹුන් වී යයි. සමහරුන් මෙම ඥානය අසන විට ප්‍රීතියෙන් උද්දාම වනවා. ඔවුන් මෙය අන් අයටද කියනවා. ඉන්පසු පිටව ගොස් ද්‍රෝහී වනවා. ඒ තරම්ම සේවයට බාධා කරයි. ඔවුන්ගෙන් ඇති වැඩේ මොකක්ද? දියමන්තියක් සේ වටිනා දියමන්තියක් වෙනුවට ඔවුන් සිප්පි කටු බවට

පත් වේ. අවසානයේදී ඔබ කළ දේ ගැන දර්ශන ලැබෙනු ඇත. ඔබ එසේ හැසිරුණ නිසා ඒ ඒ තත්ත්වයන් ලැබේ! ඔබ පිරිසිදු පුණ්‍යවන්ත ජීවාත්ම සත්තාවන් බවට පත් වන නිසා ඔබ මෙහිදී කිසිම පාපයක් නොකළ යුතුය. ඔබ කරන පාපයකට සිය වාරයක දඬුවම් ලැබෙනු ඇත. ඔබ දෙව්ලොව ගියත්, ලැබෙන්නේ ඉතා පහළ තත්ත්වයකි. ඔබ රාජ යෝග ඉගෙනීමට මෙහි පැමිණියත් පසුව යටත් වැසියන් බවට පත් වෙනවා! ඒ තත්ත්වයන් අතර ලොකු වෙනසක් ඇත. යගායාවට යමක් දී එය ආපසු ගන්නා අය සොහොන් පල්ලන් වනු ඇතැයි විස්තර කර ඇත. සමහර දරුවන්ගේ හැසිරීම් එසේ තත්ත්වය බාල වන ලෙසයි. බාබා මෙසේ විස්තර කරයි රජ හෝ රැජින වනවා වෙනුවට වැසියන් අතරේද අඩු තත්ත්වයක් ලැබෙනා ආකාරයේ ක්‍රියා නොකරන්න. යගායාවට කැප වී පැන ගිය අයට සිදුවන්නේ කුමක්ද? පරම පියා මෙයද විස්තර කර ඇත. දරුවනි, පාප ක්‍රියා නොකරන්න! සිය වාරයක දඬුවම් ලැබේවි. ඉතින් ඔබ එසේ පාඩු කර ගන්නේ ඇයි? ගෙදර සිට බොහෝ සේවය කරන අය මෙහි සිට සේවය කරන අයට වඩා බොහෝ ඉහළ තත්ත්වයක් ලබයි. ඇනා අටක් හෝ රුපියලක් එවන අය ඇත. මෙහිදී දුප්පත් අය දහස් ගණන් දෙන අයට වඩා උපයා ගනී. දුප්පත් අය එසේ ඉහළ තත්ත්වයට පත් වන්නේ ඔවුන් පාප ක්‍රියා නොකරන නිසාය. පාපයක් කළ විට, සිය ගුණනකින් දඬුවම් එකතු වෙයි. ඔබ පුණ්‍යවන්ත පිරසිදු කෙනෙක් වී හැම කෙනෙකුටම සතුට ලබා දෙන්න. දුකක් දුන්නොත් එවිට නඩු අසාවි. ඔබ කළ දේ ගැන දර්ශන දෙන අතර දඬුවම ද සඳහන් වේ. ලබන තත්ත්වය ද විනාශ වෙයි. ඇතැම් දරුවන් මෙය අසා තිබුණත් දිගටම වැරදි හැසිරීම් වල යෙදේ. පරම පියා මෙසේ කියයි සැමවිට කිරි පැණි සේ ජීවත් වෙන්න. ඔබ ලුණු වතුර සේ ජීවත් වුණොත්, බොහෝ සේවා බාධා ඇති වේ. කෙනෙකුගේ නම හා ස්වරූපයට හසු වීමද ලොකු පාපයකි. මායා මීයකු සේය. ඌ පිඹින ගමන් සපාකමින් ලේ ගැළවද නොදැනෙන්නට එය කරයි. මායාද ඔබේ ලේ සොලවයි. ඔබ කරන දේ කුමක් දැයි නොදැනෙන තරමට මායාගේ ක්‍රියා සියුම්ය. පාප පහ සම්පූර්ණයෙන් ඔබව සැපසේ රවටයි! බාබා ඔබට පරිස්සම් වන්නට කියා තිබුණා වුවත් නඩුවේ දී ඔබ කියාවි කල්තියා අවවාද කළේ නැහැ කියා. ඔබ දන්නවා පරමාත්ම දෙවියන් ඔබට උගන්වන බව. ඔහු එතරම්ම මමායනයෙන් තොරය! ඔහු මෙසේ කියයි මා ඔබේ කීකරු සේවකයාය. සමහර දරුවන්ට බොහෝ ලොකුකම ඇත! බාබාට අයිති වීමෙන් පසුවද ඔවුන් කරන ක්‍රියා ගැන අසා වැඩක් නැත. ඒ සමඟ සන්සන්දනය කරන විට මින් පිට ගෙවල් පවුල් අතර ජීවත් වන අය මීට වඩා ඉදිරියෙන් සිටී. ඔබ ශරීර අවධානයට පත් වූ විගස මායා තදින් පහර දෙයි. ශරීර අවධානය කඩා දැමීම ඉතා ඉහළ තත්ත්වයකි. ඉතින් ඔබ එසේ ලබන තත්ත්වය විනාශ කර ගන්නේ ඇයි? එහි ගිය පසු අතුපතුගාන්නන් විය යුතු නැත. බාබාගෙන් ඇසුවොත් කියාවි මේ ගැන. ඔබ හැම කෙනෙකුටම තේරුම් ගත හැකියි ඔබ කොතරම් සේවය කරනවාද? කී දෙනෙකුට සතුට ලබා දුන්නාද කියා. මමා සහ බාබා සැම කෙනෙකුටම සතුට ලබා දෙයි. ඔවුන් එතරම්ම සතුටින්ය! බොම්බේ නුවර දී බාබා බොහෝ සෙයින් ඥාන නර්ථනය නැටුවේය. එහි බොහෝ වැට්රැක් කුරුල්ලෝ (අද්භූත කුරුල්ලෝ) විසූහ. බාබා මෙසේ කියයි මා ඥාන නර්ථනය නටන්නේ එය ඇහුම්කන් දීමට ඉතා ආසාවෙන් සිටින අයට වන අතර එවිට ඉතා හොඳ කරුණුද මතු වී එයි. වැට්රැක් කුරුල්ලෝම එය ඇදලාම ගනී. ඔබද ඒ ආකාරයෙන් කළ යුතුයි, එවිට පමණි පිළිපැදීම හරි හැටි කළ හැක්කේ. ඔබ ශ්‍රීමත් පිළිපැදිය යුතුමයි. ඔබ මන්මත් භාවිත කරමින් පරම පියා නිග්‍රහවට ලක් කළ හොත් විශාල හානියක් සිදුවේ. පරම පියා දැන් ඔබ අර්ථ සහිත කරයි. භාරතය දෙව්ලොවම විය. දැන් කිසිවෙක් එය එසේ සළකන්නේ නැත. භාරතය තරම් පාරිශුද්ධ වූ වෙනත් දේශයක් නොමැත. ඔවුන් මෙය සඳහන් කළත් තේරුම් ගෙන නැහැ භාරත්වාසීන් දෙව්ලොව වාසීන් ව සිටි බව. එහි අසීමිත සතුටක් තිබිණි. ගුරුනානක් ගැයුවා දෙවියන්ගේ පැසසුම ඔහු අපිරිසිදු ඇඳුම් සේදූ ආකාරයක් ගැන. ඔහුගේ මුල්ම පැසසුම වූ කලී, ඔහු අශරීරික කෙනා බවයි. 'ශිව ප්‍රතිමා' යන්න වෙනුවට ඔවුන් යෙදූ නම 'අමරණීය සිහසුන' යන්නයි. පරම පියා දැන් ඔබට මුළු ලොවම ගැන රහස් හෙළි කරයි. දරුවනි, එකම පාපයක් හෝ නොකරන්න. එසේ නොවුණොත්, සිය වාරයක් දඬුවම් ගොඩ ගැසේ. මාව නිග්‍රහයට ලක් කළොත්, ඔබ ලබන තත්ත්වය විනාශ වී යයි. ඔබ බොහෝ ප්‍රවේශම් විය යුතුයි. ඔබේ දිවිය දියමන්තියක් සමාන තත්ත්වයට පත් කරගන්න. එසේ නොවුවහොත්, බොහෝ පසුතැවීම් සිදු වේවි. ඔබ කුමක් හෝ වරදක් කළොත්, දිගටම එය ඔබ ඇතුළතින් විඳවයි. මා මෙයම කරමින් හැම චක්‍රයකම මම ලබන තත්ත්වය පහළට ඇද දමා ගන්නවාද? පරම පියා මෙසේ කියයි ඔබ මවත් පියත් අනුගමනය කිරීමට සූදානම් නම් සේවය අවංකව කරන්න. කුමන හෝ ක්‍රමයකින් මායා ඔබ වෙතට කඩා වදී. මධ්‍යස්ථාන වල ප්‍රධානීන් සම්පූර්ණයෙන්ම මමායනයෙන් තොර අය බවට පත් විය යුතුය. බලන්න පරම පියා මොනතරම් මමායනයෙන් තොරද කියා! සමහර දරුවන් අන් අයගෙන් පෞද්ගලික සේවා ලබා ගනී. බලන්න පරම පියා මොනතරම් ලොකුකම් නැති කෙනෙක් ද කියා! ඔහු කිසිවෙක් සමඟ හෝ තරහ නොවේ. දරුවන් අකීකරු වූ කළ බාබා මෙසේ විස්තර කළ හැකියි ඔබ මොනවද

මේ කරන්නේ? අසීමිත පරම පියා පමණයි හැම දෙයක්ම දන්නේ. දරුවන් සියලු දෙනාම එක හා සමානව වටින්නේ නැත. නොවටිනා දරුවන් ද ඇතැම් විට ඇත. බාබා දිගටම ඔබට විස්තර කරයි. බොහෝ දරුවන් ඇත. සංඛ්‍යාව වැඩි වන අතර සිය දහස් ගණනින් හිඳීවි. පරම පියා දිගටම ඔබට මෙසේ අනතුරු අඟවයි දරුවනි, වැරදි නොකරන්න. ඔබ මෙහි ආවේ අපිරිසිඳු බවින් පිරිසිඳු බවට පත් වන්නයි. එමනිසා, අපිරිසිඳු ක්‍රියා නොකරන්න! කිසිවකුගේ නමට සහ ස්වරූපයට හසු නොවන්න! ශරීර අවධානයට පත් නොවන්න! ජීව සත්තාමය විඥානයට පත් වී දිගටම පරම පියා සිහි කරන්න! දිගටම ශ්‍රීමත් පිළිපදින්න. මායා බොහෝ බලවත්ය. බාබාට හැම දෙයක් ම විස්තර කර දිය හැකියි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරම පියා මෙන්ම ලොකුකමින් තොර වන්න. කිසිවකුගෙන් පෞද්ගලික සේවා භාර නොගන්න! කිසිවෙකුට දුකට හේතු වන දෙයක් නොකරන්න. දඬුවම් අත්විඳින ආකාරයේ කිසිඳු පාප ක්‍රියාවක් නොකරන්න. කිරි පැණි සේ එකට වසන්න.
2. ඔබේ මන්මත් නොව එකම පරම පියාගේ ශ්‍රීමත් පිළිපදින්න.

**වරදානය:** ඔබ තම ශරීර වස්ත්‍රයෙන් තත්පරයකදි වෙන් වීමෙන් සියළු බලයන්ගෙන් පිරිපුන් වී, කර්මයේ විඳවීමෙන් නිදහස් වේවා.

කර්මයේ විඳවීමේ බලය තිබෙන විට ඔබගේ භෞතික ඉන්ද්‍රියයන් ඔබගේ කර්මයේ විඳවීම දෙසට ඔබව ඇද ගනී. එම විඳවීමේ බලපෑම නිසා බොහෝ වේදනා ඇති ඕනෑම විටෙක, එම කර්මයේ විඳවීම (කර්ම බෝග්) කර්ම යෝගාවට පරිවර්ථනය කරන අය, නොබැඳි නරඹන්නන් ලෙසින් එම ශරීර ඉන්ද්‍රියයන්ගේ විඳවීම පසු කරමින් යන අය, සියළු බලයන්ගෙන් පිරිපුන් ජයග්‍රාහී අෂ්ඨ මැණික් ලෙස හඳුන්වයි. මේ සඳහා දීර්ග කාලයක් පුරා ඔබගේ ශරීර වස්ත්‍රයෙන් වෙන්ව සිටීම පුහුණු වන්න. ලෝකයට ආකර්ෂණය වීම නිසා ඔබගේ වස්ත්‍රය සිරුරට තද නොවිය යුතුයි, එනම්, එය ඇදී නොයා යුතුයි. එය පහසුවෙන් ගැලවී යන්නේ එවිට පමණයි.

**පාඨය:** සියළු දෙනාගේ ගෞරවය ලබා ගැනීම සඳහා නිහතමානී හදවතක් තබා ගන්න; නිහතමානිකම, ශ්‍රේෂ්ඨත්වයේ ලක්ෂණයකි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබගේ විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කරගෙන නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන් රැඳී සිටින්න.**

උසස් උපකරණ ජීවාත්මයක් ශාරීරිකව ඔබ සමග සිටින්නේ නම් සහ ඔබ යම් දෙයක් ඇය හෝ ඔහුගෙන් විමසා පැහැදිලි කරගන්නේ නම්, ඔබට එසේ කිරීමට හැකි වන්නේ ඔබගේ බුද්ධියේ විශ්වාසය තිබෙන නිසයි. ඔබ එසේ කරන්නේ බිය නොමැතිකම සහ විශ්වාසය යන ගුණධර්ම දෙක ඔබ ඉදිරියේ තබා ගෙනයි. ඔබ සමග නිරන්තරයෙන් විශ්වාසය සහ නිර්භීතකම තිබෙන විට ඔබගේ ශ්‍රේෂ්ඨ සිතිවිලි වල නිරන්තර ජයග්‍රහණය ඇති වෙයි. ඔබට කුමන සිතිවිලි ඇති වුනත්, අශාරීරික සහ ශාරීරික කෙනා ඔබ සමග හෝ ඔබ ඉදිරියේ සිටියි, විශ්වාසයෙන් සහ නොබියව ඒවා නිවැරදිදැයි පැහැදිලි කරගන්න, එවිට කාලය අපතේ නොයයි.

**මාතේශ්වරීජීගේ අමිල ශ්‍රේෂ්ඨ වදන්**

**1) පරමාත්ම දෙවියන් සර්ව ව්‍යාප්ත නොවන බවට සාක්ෂි මොනවාද?**

සියලු ශාස්ත්‍රවල මාණික්‍යය වන ගීතාවේ, පරමාත්ම දෙවියන්ගේ වදන් වන්නේ දරුවනේ ජයග්‍රහණය ඇති තැන, මා එතනයි. පරමාත්ම දෙවියන්ගේ ශ්‍රේෂ්ඨ වදන් මේවාය. උසම කඳු වන හිමාලයේ මා සිටිනවා,

එමෙන්ම සර්පයන් අතරේ, කාල වර්ණ සර්පයා මමයි. මේ නිසයි කඳු අතරින් ඔවුන් කයිලාශ් කන්ද පෙන්වන්නේ, එමෙන්ම සර්පයන් අතරින් ඔවුන් කළු සර්පයෙක් පෙන්වන්නේ. මින් ඔප්පු වන්නේ පරමාත්ම දෙවියන්, සියලු සර්පයන් අතරින් කළු සර්පයෙක් තුළ පමණක් සිටින්නේ නම්, ඔහු සියලු සර්පයන් තුළ නොමැති බවයි. දෙවියන් උසම කන්දේ සිටිනවා නම්, එවිට ඔහු පහත් කඳු වල නොමැත, ඉන්පසුව මෙසේ කියයි ජයග්‍රහණය ඇති තැන, උපත තිබේ, එනම්, ඔහු පරාජය වන්නේ නැත. මේ දේවලින් ඔප්පු වන්නේ පරමාත්ම දෙවියන් සෑම තැකනම නොසිටින බවයි. එක් අතකින් ඔවුන් මෙය පවසන අතර ඉන්පසුව අනෙක් අතට ඔවුන් කියන්නේ, දෙවියන් බොහෝ ස්වරූප වලින් පැමිණෙන බවයි, එමෙන්ම ඔවුන් දෙවියන්ගේ අවතරණ 24ක් පෙන්වා ඇත. මත්ස්‍යයින් සහ කිබුලන් ආදී සියල්ලම දෙවියන්ගේ ස්වරූප බව ඔවුන් කියයි. මෙය ඔවුන්ගේ ව්‍යාජ දැනුමයි. ඔවුන් සලකන්නේ දෙවියන් සෑම තැනකම සිටින බවයි, නමුත් ඇත්ත වශයෙන්ම කලි යුගයේ සෑම තැනකම සිටින්නේ මායාය. එසේ නම් පරමාත්ම දෙවියන් සෑම තැනකම සිටින්නේ කෙසේද? ගීතාවේද මෙසේ සඳහන් කර ඇත මම මායා තුළ නොමැත. පරමාත්ම දෙවියන් සෑම තැනකම නොසිටින බව, මින් ඔප්පු වෙයි.

## 2) අශාරීරික ලෝකය - ජීවාත්ම සහ පරමාත්ම ජීවයගේ වාසස්ථානය.

අපි අශාරීරික ලෝකය ගැන කතා කරන විට, අශාරීරික යනු එයට ස්වරූපයක් නොමැති බව නොවෙයි. අපි අශාරීරික ලෝකය ගැන කතා කරන විට, එයට නියත වශයෙන්ම අරුතක් තිබේ. අනිවාර්යෙන්ම ලෝකයක් තිබෙනවා, නමුත් භෞතික ලෝකයට මෙන් ස්වරූපයක් එයට නැත. ඒ ආකාරයෙන්ම, පරමාත්ම ජීවය අශාරීරික වන නමුත් ඔහුට අනිවාර්යෙන් ඔහුගේම සූක්ෂම ස්වරූපයක් තිබේ. එබැවින් ජීවාත්ම වන අපගේ සහ පරමාත්ම ජීවයගේ දේශය, අශාරීරික ලෝකයයි. එබැවින් අපි ලෝකය ගැන පවසන විට, එහි ලෝකයක් ඇති බවත් අප එහි වාසය කරන බවත් පෙන්වයි, මේ නිසයි එයට 'ලෝකය' යන නම ලබා දී තිබෙන්නේ. ලෝකයේ මිනිසුන් සිතන්නේ පරමාත්ම දෙවියන්ගේ රූපය සදාතනික ආලෝක පදාර්ථය බවයි, නමුත් එය දෙවියන්ගේ වාසස්ථානයයි, එය විශ්‍රාමික නිවහන ලෙසත් හැඳින්වෙයි. එබැවින් පරමාත්ම දෙවියන්ගේ නිවහන, දෙවියන් බව, අපට කිව නොහැක. අනෙක් ලෝකය බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර් යන දේවතාවන් ඔවුන්ගේ සූක්ෂම ස්වරූප වලින් වාසය කරන සූක්ෂම ලෝකයයි. මෙය කොටස් දෙකකින් යුත් භෞතික ලෝකයයි. එකක් කල්ප භාගයකට සම්පූර්ණ සතුට, පාරිශුද්ධත්වය සහ සාමය තිබෙන පාපයෙන් තොර දිව්‍ය ලෝකයයි. අනෙක දුක සහ අසාමයේ දූෂිත කලි යුග ලෝකයයි. මෙම ලෝක දෙක තිබෙන බව අප පවසන්නේ ඇයි? මන්ද දිව්‍ය ලෝකය සහ අපාය යන දෙකම දෙවියන් නිර්මාණය කරන බව මිනිසුන් පවසන බැවින්, නමුත් මේ සඳහා පරමාත්ම දෙවියන්ගේ වදන් වන්නේ දරුවනේ, මා දුක් ලෝකය නිර්මාණය කළේ නැත. මා නිර්මාණය කරන ලෝකය, සතුටු ලෝකයයි. දුක සහ අසාමයේ ලෝකය තිබෙන්නේ, මනුෂ්‍ය ජීවාත්ම, තමන්ව සහ පරමාත්ම ජීවය වන මාව අමතක කර ඇති නිසාය, ඔවුන් දුක් විඳින්නේ මේ නිසයි. කෙසේවෙතත්, සතුටු සහ පුණ්‍යවන්ත ලෝකය තිබෙන විට, එහි ලෝකයක් නොමැත්තේ නැහැ, ඔව්, එහි දේවතාවන් වාසය කරන බව අප පවසන විට, එහි අනිවාර්යෙන් සියලු ක්‍රියාකාරකම් තිබුණා. කෙසේවෙතත්, එහි පාපය තුළින් නිර්මාණයක් සිදු නොවුණු බව සහතිකයක් වන අතර මේ නිසා, කර්මික බන්දන නොතිබුණි. එබැවින් එකක් අශාරීරික ලෝකය වන අතර අනෙක සූක්ෂම ලෝකයද, තුන්වැන්න භෞතික ලෝකයයි. අච්චා.